# ආර්‍ය අනාර්‍ය සංස්කෘතීන් මිශ්‍රවීම

අධ්‍යාපනය වෙළෙඳාමක් වී වෙළෙඳාම අධ්‍යාපනයක් වී ඇති ලෙස සංස්කෘතිය ද වෙළෙඳාමක් වී ඇති අතර වෙළෙඳාම අද සංස්කෘතියේ ප්‍රධාන අංගයක් වී ඇත. අද සංස්කෘතිය ද අළෙවි කළ හැකි භාණ්ඩයක් වී ඇත්තේ අධ්‍යාපනය ද (දැනුම ද) වෙළෙඳ භාණ්ඩයක් වී ඇති ආකාරයට ය. සංස්කෘතිය අළෙවි කරන්නන් සිටින්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි අද දක්වා විකාශය වී ඇති යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි සංස්කෘතිය ද විකිණෙයි.

සංස්කෘතිය විකිණෙන්නේ ජනමාධ්‍යයෙහි පමණක් නො වෙයි. විශ්වවිද්‍යාලවල ද සංස්කෘතිය විකිණෙයි. සංස්කෘතිය අධ්‍යයනය කිරීම, ඊනියා සංස්කෘතික ලේඛකයන් ගැන හැදෑරීම අද බටහිර විශ්වවිද්‍යාලවල අංග බවට පත් වී ඇත. කලා කෘතීන් විකිණීම, සාහිත්‍ය කෘති විකිණීම, නාට්‍ය හා චිත්‍රපට විකිණීම, එනම් එවා මුදල් ගෙවා බැලීමට සිදුවීම ආදිය සංස්කෘතිය විකිණීමේ කාර්‍යයට අයත් වෙයි. මුදල් ගෙවා කෞතුකාගාරයක් නැරඹීමේ දී ද සිදුවන්නේ සංස්කෘතිය විකිණීමක් හා මිළ දී ගැනීමකි.

එහෙත් මෙයටත් වඩා බරපතළ කාර්‍යයක් මුළු ලෝකය පුරා ම සිදුවෙයි. එනම් බටහිර සංස්කෘතිය ලෝකය පුරා ම අලෙවි කිරීම ය. බටහිර සංස්කෘතිය, සංස්කෘතියක් ලෙස ගත්කල ද ලෝකයෙහි ම අලෙවි කෙරෙයි. මේ මෙතෙක් ලෝකයා  විසින් අත්නොවිඳනු ලැබූ අත්දැකීමකි. අතීතයේ ලෝකයේ සංස්කෘතීන් මුන ගැසුණු කල එවා මිශ්‍ර වීමක් සිදුවිණි. කලින් සඳහන් කළ ආකාරයට උගතුන් වෙළෙඳුන් මෙන් ම ආක්‍රමණිකයන් හා සාංක්‍රමණිකයන් ද ඔස්සේ මෙද සංස්කෘතික මිශ්‍රණය සිදු විය. ඒ ඔස්සේ සංස්කෘතියක් තවත් සංස්කෘතියක අංග අවශෝෂණය කර ඇති ආකාරය නිරීක්‍ෂණය කළ හැකි ය.

ඇතැම් අවස්ථාවක ආක්‍රමණිකයෝ තම සංස්කෘතිය අනෙක් ජාතියක් මත බලයෙන් පැටවීමට උත්සාහ ගත්හ. තවත් අවස්ථාවක ආක්‍රමණයට ලක්වූ ජනතාව ආක්‍රමණිකයන්ගේ සංස්කෘතිය අවශෝෂණය කළහ. දඹදිවට පැමිණි ආර්‍යයෝ තම සංස්කෘතිය අනාර්‍ය හෙවත් ප්‍රාග් වෛදික ජනතාව මත පැටවූහ. ඒ සංස්කෘතියේ හා අනාර්‍ය සංස්කෘතියේ මිශ්‍රණයෙන් වෛදික සංස්කෘතිය ඇතිවිණි. වෛදික සංස්කෘතියේ ආර්‍ය සංරචකය ඉතා බලවත් විය. මානි ජෝෂි මහතා හා තවත් අය පෙන්වා දී ඇති ආකාරයට පසුව මේ වෛදික ආක්‍රමණය සංස්කෘතික වශයෙන් තරමක් ආපස්සට යැවිණි.

අප කලින් සඳහන් කර ඇති ආකාරයට බුද්ධදහම හා ජෛනආගම පහළ වූයේ අර්ධ වෛදික සංස්කෘතීන් හි ය. ඒ සංස්කෘතියෙහි වෛදික සංරචකය ඉතාමත් දුර්වල විය. බුද්ධදහම හා ජෛනආගම පසුව වෛදික ආගම් කෙරෙහි විශාල බලපෑමක් ඇති කෙළේ ය.  ජෝෂි (Joshi) මහතා හා වෙනත් උගතුන් ලියා ඇති පොතපතින් අපට එළඹිය හැකි නිගමනය නම් ඍග් වේදය වැනි මුල් වේද ග්‍රන්ථ වෛදික සංස්කෘතියෙහි ලියැවී ඇති නමුත් පසුව ලියැවුණු ආරණ්‍යක හා උපනිෂද් ග්‍රන්ථවලට අනාර්‍ය අර්ධ වෛදික සම්ප්‍රදාය බලපා ඇති බව ය.

ඇතැම් මතයකට අනුව අනාර්‍ය (ද්‍රවිඩ නොවන බව පුන පුනා කිවයුතු වන්නේ බටහිරයන්ගේ උසිගැන්වීම මත ද්‍රවිඩ හා වෙනත් උගතුන් ඉන්දියාවේ ද ලංකාවේ ද පොදුවේ ලෝකයේ ද අනාර්‍ය යනු ද්‍රවිඩ වේය යන මතය තහවුරු කිරීමට උත්සාහ කරන බැවිනි.) ශ්‍රමණ සම්ප්‍රදායේ බලපෑම යටතේ ඇතැම් වෛදික බමුණෝ අප්‍රසිද්ධියේ ආරණ්‍යවලට ගොස් අනාර්‍ය මත ද තම වේද ග්‍රන්ථවලට ඇතුළත් කළහ.  ඒ බමුණන්ට වෛදික මත දැඩිව ගත් අනෙක් බමුණන්ගෙන් තර්ජන එල්ල වූ බැවින් ඔවුන්ට ආරණ්‍යගත වීමට සිදු විය.

උපනිෂද් ග්‍රන්ථ ලියැවී ඇත්තේ බුදුන්වහන්සේගේ සමයෙහි හෝ ඉන් පසුව හෝ බව ජෝෂි මහතා පෙන්වා දෙයි. උපනිෂද් ග්‍රන්ථවලට අනාර්‍ය අර්ධ වෛදික සංස්කෘතියක බිහි වූ බුද්ධදහමෙහි ආභාසය ලැබී ඇති බව ජෝෂි මහතා තහවුරු කරයි. ඉන්පසු කලෙක කිතුවසින් හයවැනි සියවසෙහි පමණ ශංකරාචාර්‍යවරයන් නාගර්ජුන හිමිපාණන් වහන්සේගේ ශූන්‍යතාව ඇසරෙන් නිර්ගුණ් බ්‍රහ්මන් නම් සංකල්පය නිර්මාණය කර අද්වෛත වේදාන්තයත් හින්දු

© Prof. Nalin De Silva

ආගමත් නිර්මාණය කිරීමෙන් ලෝකයේ ඇති වූ ඉතා සංකීර්ණ සංස්කෘතික මිශ්‍රණයක් යම් කෙළවරකට පැමිණ ඇති බව පැහැදිළි ය.

මේ සංස්කෘතික මිශ්‍රණය රෙඩ්ෆීල්ඩ් මහතාගේ ඊනියා මහා සම්ප්‍රදායෙන් හා චූල සම්ප්‍රදායෙන් තේරුම් ගැනීමට නො හැකි ය. දඹදිවට වයඹ දෙසින් පැමිණි ආර්යයෝ ආක්‍රමණිකයෝ වූහ. ඔවුන් මුලදී සැලැස්මක් නැතිව වුව ද ක්‍රියා කරන්නට ඇත්තේ ඔවුන්ගේ සංස්කෘතිය දඹදිව ප්‍රචලිත කරන්නට ය. එසේත් නැතහොත් දඹදිව සංස්කෘතියෙන් ගත් යම් සංරචකයක් සහිත ව තම සංස්කෘතිය ප්‍රදේශයෙහි පැතිර වීම ය. සවිඥානික සැලැස්මක් නැතිව වුව ද ආක්‍රමණිකයන් ක්‍රියාකරන්නේ එසේ ය. ආර්යයෝ විශේෂයෙන් ම සංස්කෘතික කණ්ඩායමක් ලෙස තම සංස්කෘතිය දඹදිව තහවුරු කිරීමට උත්සාහ ගත්හ.

ආර්යයෝ වර්ණ භේදයක් නමින් කුල භේදයක් දඹදිව ඇති කළහ. ඔවුන් බටහිරින් ගෙනා ඒක දේවවාදය බ්‍රහ්මන් නමින් දඹදිව තහවුරු කළහ. එහෙත් ඔවුනට දඹදිව අනාර්ය සංස්කෘතියෙන් යම් යම් දෑ ගැනීමට සිදුවිය. පුනරුත්පත්තිය, ඇතැමුනට අනුව නම් පුනබ්භවය එවැනි සංකල්පයකි. සංසාරය පිළිබඳ අදහස ද ආර්යයන් දඹදිවින් ලබාගත් එකක් විය. ආර්යයෝ වර්ණ භේදය පදනම් කරගනිමින් අළුත්ම පූජක පිරිසක් ඇතිකළහ. මේ පූජක පිරිස කුල ධුරාවලියෙහි ඉහළින් ම ස්ථානගත කෙරුණු බ්‍රාහ්මණයෝ වූහ. බමුණෝ දඹදිව තිබූ අනාර්ය ශ්‍රමණ සම්ප්‍රදාය හා යෝග භාවනා ක්‍රම අත්හැරියහ. ඒ වෙනුවට බ්‍රහ්මන් හා ජනතාව අතරමැදි පිරිසක් වූ තමන් මගින් බිලි පූජා පැවැත්වීමෙන් ජනතාවට විමුක්තිය ලබාගැනීමට ඉගැන්වූහ.

එහෙත් බමුණන්ට දඹදිව  අනාර්ය අනෙක් දෙවිවරු අත්හැරීමට නො හැකි විය. එයට හේතු වන්නට ඇත්තේ ඒ දෙවියන් ජනතාවගේ සිත් සතන් තුළට ඉතා දැඩිව ඇතුල්වී තිබුණු බැවින් යැයි සිතා හත හැකි ය. බමුණෝ දඹදිව සිටි ඇතැම් දෙවියන් ද තම පද්ධතිය තුළට ගත්හ. ඒ දෙවියන්ගෙන් සමහරකු බ්‍රහ්මන්ගේ අවතාර බවට පත්කිරීමට තරම් බමුණෝ උපක්‍රමශීලී වූහ. ක්‍රිෂ්ණ ද එවැනි දෙවියකු බව ජෝෂි මහතා පෙන්වයි. මහාභාරතයෙන් නිරූපණය වන්නේ මේ සංස්කෘතික මිශ්‍රණයෙහි  එක් අවස්ථාවක් බව ඇතැම් උගතුන්ගේ පිළිගැනීම ය. තම සංස්කෘතිය තුළට ගත් ක්‍රිෂ්ණ දෙවියන්ට මහාභාරතයේ ඉතා වැදගත් තැනක් දීමට බමුණෝ වගබලාගත්හ. ජෝෂි මහතාගේ පිළිගැනීම අනුව දඹදිව සංඛ්‍යා දර්ශනයෙන් ගත් දෑ ද මහාභාරතයෙහි අඩංගු වෙයි.

ඉන්ද්‍ර දෙවියන් යනු යක්ෂ ගෝත්‍රිකයන්ගේ ඒ නමින් ම වූ දෙවි කෙනකු වෛදික සංස්කෘතියට අවශෝෂණය කිරීමෙන් නිර්මාණය කරගත් දෙවි කෙනෙකි. යක්ෂ ගෝත්‍රිකයන්ගේ ඉන්ද්‍ර දෙවියන්ගේ භාර්යාව ඉන්ද්‍රාණි යනුවෙන් හැඳින්වෙයි. යක්ෂ ගෝත්‍රිකයන්ගේ දෙවිවරුන්ගෙන් ඇතැමුන් තම සංස්කෘතියට ඇතුල්කරගත් ආර්යයෝ (වෛදිකයෝ) යක්ෂ ගෝත්‍රිකයන්ගේ අනෙක් දෙවිවරුන් පහත මට්ටමකට ඇද දමා ඔවුන් යක්ෂයන් ලෙස ම හැඳින්වීමට කටයුතු කර ඇති බව පැහැදිළි ය. යක්ෂ ගෝත්‍රිකයන් තම දෙවිවරුන් ද යක්ෂ නාමයෙන් ම හඳුන්වා ඇති බව පැහැදිළි ය. මේ දේවත්වයට පත්කරනු ලැබූ යක්ෂයෝ මියගිය නෑ යක්කු වූහ. එබැවින් ඒ දෙවියන් ද යක්ෂ නමින් හඳුන්වනු ලැබීම පුදුමයක් නො වෙයි. වෛදිකයෝ ඒ යක්ෂයන්ගේ දෙවියන් ඔවුන්ට අවශ්‍ය වූ අවස්ථාවල තම දෙවියන් බවට පත්කරගෙන අනෙක් අවස්ථාවල යක්ෂ නමින් ම පහත් තත්වයකට පත්කර ඇති බව පැහැදිළි ය.

වෛදික බමුණෝ බුදුන් වහන්සේ ද බ්‍රහ්මන්ගේ අවතාරයක් බවට පත්කළහ. ඒ ඉන්ද්‍ර වැනි දෙවියන්ට ද වඩා උසස් තත්වයකි. ඉන් කියැවෙන්නේ බුදුන් වහන්සේ හා බුදුදහම දඹදිව සමාජයෙහි අත්පත් කරගෙන තිබූ තත්වය ය. බමුණන් ඒ ඒ දෙවිවරුන් හා අනාර්ය ශ්‍රමණ සම්ප්‍රදායට අයත් ශාස්තෘන් වහන්සේ හා වෙනත් අයට ඔවුනොවුන්ගේ තරාතිරම අනුව සළකා ඇති බව පෙනෙයි. බමුණන් අතින් එවැනි ඇතැම් දෙවිවරුන්ට හා ශාස්තෘන් වහන්සේට බ්‍රහ්මන්ගේ අවතාර තත්වය ලබා දී ඇති අතර ඇතැම් දෙවිවරු (යක්ෂයන් ද ඇතුව) තම දෙවිවරුන් බවට පත්කරගෙන ඇත. බමුණන් විසින් තම දෙවියන් බවට පත්කරගනු ලැබූ දෙවිවරු වෛදික දෙවිවරු බවට පත් වී ගරු බුහුමන් ලැබූහ. ඒ අතර තවත් යක්ෂ හා වෙනත් දෙවිවරු දේවත්වය නැතිකෙරී  පහත් තත්වයකට ඇද දමනු ලැබූහ.

බලි බිලි පුදා විමුක්තිය ළඟා කරගැනීමට කියා දුන් බමුණෝ පසු කලෙක බුද්ධ දහමේ හා ජෛන ආගමේ ආභාසයෙන් අහිංසාව පුරුදු කළහ. වෛදික ආගම් හින්දු ආගම බවට පත්වීමේ දී මේ කරුණ ද බලපෑවේ ය. හින්දු ආගමෙහි යම්

© Prof. Nalin De Silva

අහිංසාවක් ඇත්නම් ඒ ගලා එන්නේ වෛදික ආගම්වලින් හා සංස්කෘතියෙන් නොව වෛදික සංස්කෘතියට පසුව ඇතුල් වූ අර්ධ වෛදික සංස්කෘතියක බිහි වූ බෞද්ධ ධර්මයෙන් හා ජෛන ආගමෙන් ය.

අනෙක් පැත්තට බුද්ධදහමට වූ වෛදික බලපෑම් ද විය. විශේෂයෙන් ම ආත්මවාදී බමුණන්ගෙන් එල්ල වූ අභියෝග හමුවේ ඇතැම් භික්ෂූන් වහන්සේ අනාත්මය තේරුම් කර දීමට අනාත්මය සඳහා ප්‍රවාද ගොඩනැගීමට උත්සාහ ගත්හ. මෙහි දී විශේෂයෙන් ම බ්‍රාහ්මණ වංශයේ උපත ලබා පැවිදි වූ භික්ෂූන් වහන්සේ පෙරමුණ ගෙන ඇති බව පැහැදිළි ය. උන්වහන්සේලා ට ගිහි ජීවිතයේ දී යම් පමණකටවත් හිමි වූ බ්‍රාහ්මණ සම්ප්‍රදායේ ප්‍රවාද ගොඩනැගීම එහි දී බලපාන්නට ඇතැයි සිතිය හැකි ය.

බමුණන් යුදෙව්වන් තරම් වියුක්ත ප්‍රවාද ගොඩනැගීමෙහිලා දක්ෂ නොවූ නමුත් ඔවුන්ට ද යම් මට්ටමකට වියුක්ත ප්‍රවාද ගොඩනැගීමට හැකි විය. වියුක්ත ප්‍රවාද ගොඩනැගීම කළ යුත්තේ යම් සීමාවන් තුළ ය. බ්‍රාහ්මණ වංශයෙන් පැවිදි වූ ඇතැම් භික්ෂූන් වහන්සේ සීමාව ඉක්මවා ගොස් ඇති බව පෙනෙයි. සංකල්පයක් නොවූ අනාත්ම සඳහා ප්‍රවාදයක් ගොඩනැගිය හැකි නො වේ. අනාත්මය අනාත්මවාදයක් බවට පත්කර ප්‍රවාද ගොඩනැගීමට ගිය කල ඒ කෙළවර වන්නේ ආත්මවාදයක් බවට පත්වීමෙනි. අසංග වසුබන්ධු ආචාර්යවරුන් වහන්සේට සිද්ධ වූයේ එයයි. ආලය විඥානය පිළිබඳ ප්‍රවාදය යනු තවත් ආත්මවාදයක් පමණක් ම විය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva